# කොවිඩ් 19 - සති පාසල 10 ශ්‍රේණිය

## 8 වන පාඩම - මහනුවර රාජධානිය

සැකසුම - M.P.A ප්‍රදීප් කුමාර කෑ / දෙහි කිතලංගමුව ක . වි

- නිපුණතාවය - ශ්‍රී ලංකාවේ රජවරුන්ගෙන් ශ්‍රේෂ්ඨත්වය අගයමින් දේශීය උරුමය රැක ගැනීමට පෙළඹෙයි.
  නිපුණතා මට්ටම - 8 . 1 මහනුවර රාජ්‍යජධානියේ ආරම්භය හා ව්‍යාප්තිය පිළිබඳ තොරතුරු විමසා බලයි.
  විෂය සන්ධාරය / පාඩම - මහනුවර රාජධානිය

- ඉගෙනුම් ඵල -
  - මහනුවර රාජධානියේ ආරම්භය හා ව්‍යාප්තිය විස්තර කරයි.
  - මහනුවර රාජධානියේ රජවරුන්ගේ ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි කරයි.
  - මහනුවර රාජධානියේ ස්වාධීනත්වය ආරක්ෂා වූ ආකාරය පහදයි.

(3) ශිෂ්‍යයා කළ යුතු කාර්යයන් -

දුවේ පුතේ ඔබ 8 ශ්‍රේණියේ දී මහනුවර රාජධානිය පිළිබඳව පාඩමේ දී එම රාජධානියේ ආරම්භයත් එහි පාලකයින් පිළිබඳවත් තොරතුරු අධ්‍යනය කළා. එහිදී එහි පිහිටීම , ආරම්භය මහනුවර රාජධානියේ පාලකයින් සහ එම රාජධානියේ සුවිශේෂී ලක්ෂණ පිළිබඳව ඉගෙන ගත්තා. අද මෙම පාඩමෙන් මහනුවර රාජධානිය පිළිබඳ තවත් ගැඹුරින් සහ විස්තරාත්මකව තොරතුරු අධ්‍යනය කරමු. ඔබ 8 ශ්‍රේණියේ දී උගත් කරුණු ද මතක් කරමින් මෙහි එන කරුණු හා සසඳා බැලීමෙන් වඩාත් ගැඹුරු සහ විස්තරාත්මක අවබෝධයක් ලබා ගැනීමට උත්සහ කරන්න.

**මේ අනුව සිතා බලා පහත ක්‍රියාකාරකම්වලද යෙදෙන්න**. එහිදී පහළින් දක්වා ඇති අනෙකුත් පොත්පත් හා මූලාශ්‍රයන් ද අධ්‍යනය කරන්න.

(1) නායක්කර් රාවංශයට උඩරට රාජධානියේ බලය හිමි වීමට බලපෑ හේතු හේතුව කුමක් ද?

.

(2) නායක්කර් රජ පෙළපතට අයත් පාලකයින් පිළිවෙලින් ලියා දක්වන්න.

(3) ශ්‍රී විජය රාජසිංහ රජු උඩරට රාජධානිය තුළ සිය බලය ස්ථාවර කර ගැනීම සඳහා අනුගමනය කළ ක්‍රියාමාර්ග තුනක් නම් කර එය කෙටියෙන් විස්තර කරන්න.

(4) කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ පාලන සමයේ දේශපාලන හා ආගමික වැදගත්කම පිළිබඳව වෙන වෙනම පැහැදිලි කරන්න.

(5) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලන සමයේ සිදු වූ වැදගත් දේශපාලන සිදුවීම් මොනවා ද?

- ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කර ගත හැකි පොත්පත් , වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක .
  දුවේ පුතේ ඔබට පහත සඳහන් වෙබ් අඩෙවි බැලීමෙන් සහ පහත පොත්පත් කියවීමෙන් මෙම පාඩමට අදාල තවත් තොරතුරු එකතු කරගැනීමට පුලුවන් .

  1) e - තක්සලාව

  2) e - නැණ පියස - http:/ www. enenapiyasa.lk

  3) You tube නාලිකාවේ මහනුවර රාජධානියට අදාල මාතෘකා සඳහා ඇති තොරතුරු

  4) පොත්පත් - 8 ශ්‍රේණිය සහ 10 ශ්‍රේණිය පෙළපොත් - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

  අ . පො . ස ( උ . පෙළ ) ශ්‍රී ලංකාවේ ඉතිහාසය II කොටස - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තුමේන්තුව

  ශ්‍රී ලංකාවේ ඉතිහාසය II වෙළුම - ඇම් . ඩී ගුණසේණ සහ සමාගම

  IV වෙළුම

  එදා හෙළ දිව - රොබට් නොක්ස්

  ඩේවි දුටු ලංකාව - ජෝන් ඩේවිඩ්